(නවවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 1(19).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 නොවැම්බර් 30 බදාදා**

---

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 37/2022

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු විමල් වීරවංශ මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු අසංක නවරත්න මහතා,— රට තුළ සීඝ්‍ර ලෙස පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳව කරුණු සොයා බලා ඒ පිළිබඳ ව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,–

මේ වනවිට මත් උවදුර රට තුළ දරුණු ව්‍යසනයක් ලෙස පැතිර යමින් පවතින හෙයින් ද;

නාගරික ප්‍රදේශවල පමණක් නොව දුර බැහැර ග්‍රාමීය ප්‍රදේශවල සමාජයේ යහ පැවැත්මට මෙමඟින් දැඩි බලපෑමක් එල්ල වී ඇති හෙයින්ද;

ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයන් මෙහි ග්‍රහණයට ලක් වෙමින් පවතින හෙයින් ද;

විශේෂයෙන් පාසල් දරුවන් සහ තරුණ පරපුර මත් උවදුරෙහි ගොදුරු බවට පත්වීම සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින හෙයින් ද;

මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ සංවිධානාත්මක කණ්ඩායම් විසින් සිදු කරන අපරාධ හේතුවෙන් සමාජය තුළ භීෂණකාරී තත්ත්වයක් උද්ගත වී ඇති හෙයින් ද;

මෙම තත්ත්වය වහා පාලනය නොකළහොත් සමාජමය, ආර්ථිකමය හා සෞඛ්‍යමය වශයෙන් ඇතිවන දැඩි පරිහානිය යථා තත්ත්වයට පත් කිරීම දුෂ්කර වන හෙයින් ද;

රට තුළ සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින මත්ද්‍රව්‍ය උවදුර වහා පාලනය කොට මුලිනුපුටා දැමීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ක්‍රමවේද පිළිබඳ කරුණු සොයා බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරනු ලැබිය යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතුය.

3. එම කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස හයක (06) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.